# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,716 — 1966 ඔක්තෝබර් 7 වැනි සිකුරාද — 1966.10.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන | 697 | ආදායම හා වියදම් පිළිබඳ ප්‍රකාශන | 700 |
| තනතුරු-ඇබෑර්තු | — | අය-වැය ලේඛන | 704 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | 699 | ටෙන්ඩර් පත්‍ර විකිණීම | — |
| අතුරු ව්‍යවස්ථා | 699 | මාර්ග කොමිටි දැන්වීම | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම | 700 | විවිධ දැන්වීම | 705 |


## පළාත් පාලන නිවේදන

ඇල්.ඕ.—බී 69/41—ප.පා.දෙ.ජී.ඊ 1/1/39.

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, ඒ වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොලොන්නාව ගම් ප්‍රදේශය තුළ ඉඩම්බද්දක් පනවා අය කිරීමට එකී ගම් ප්‍රදේශයේ ගම්සභාවට මේ නිවේදනයෙන් බලය පවරමි.

එම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දීය.

10–195—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඕ.—ඕ. 49/55.

### නානායම් සනත

(275 වැනි අධිකාරය වන) නානායම් පනතේ 4 වැනි වගන්තිය යටතේ තංගල්ලේ නානායම සම්බන්ධයෙන්, ඒ වෙනුවෙන් නිසි බලධාරියා වන තංගල්ල නගර සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද ව්‍යවස්ථාවයි.

ජී. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966.9.15 දින, කොළඹ.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් එය එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 ජුලි මස 15 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

### ව්‍යවස්ථාව

තංගල්ල නගර සභාව විසින් සම්පාදිතව, 1956 මාර්තු 2 වන දින අංක 10,899 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ තංගල්ල තානායමට සම්බන්ධ ව්‍යවස්ථා, ඊට යාකොට ඇති උපලේඛනය වෙනුවට මීට යාකොට ඇති උපලේඛනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

## උපලේඛනය

### නතරව සිටීම

| | රු. | ශ. |
|---|---|---|
| (1) තානායමේ (නිදන කාමරයක් නොවන) යම් කොටසක නැවතී සිටින එක් එක් තැනැත්තකු වෙනුවෙන් සෑම පැයකට හෝ ඉන් කොටසකට ... ... | | .25 |
| තානායම් භාරකරු විසින් පිළියෙල කරන ලද ආහාර වේලක් නොවන වෙනත් ආහාර වේලක් තානායම් භූමියේදී ගන්නා එක් එක් තැනැත්තා විසින් ශත 10 ක අතිරේක ගාස්තුවක් ගෙවිය යුතුය. | | |
| (2) තානායමේ නිදන කාමරයක් පාවිච්චි කරන එක් එක් තැනැත්තා වෙනුවෙන්— | | |
| (අ) යම් දිනක පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා යම් කාල සීමාවකට ... | 2 | 00 |
| (ආ) යම් දිනක පස්වරු 6.00 සිට පසුදා පෙරවරු 6.00 වනතුරු යම් කාල සීමාවකට ... | 2 | 50 |
| (ඇ) පැය 12 කට වැඩිවන එහෙත් පැය 24 කට වැඩි නොවන යම් කාල සීමාවකට ... | 3 | 00 |

(ඇඳක්, සොපාවක් හෝ කච්චියක් පාවිච්චි කිරීමත්, ඇඳ ඇතිරිලි, මේස ඇතිරිලි, තුවා සහ විදුලි එළිය පාවිච්චි කිරීමත් මේ මුදලට අයත් වේ.)

### මෝටර් රථ හා වෙනත් රථවාහන

(1) රථවාහනය තබන තැනැත්තා තානායමේ නතර වී සිටින අවස්ථාවක, ගරාජයක තබන සෑම මෝටර් කාරයක්, මෝටර් සයිකලයක් හෝ වෙනත් රථ වාහනයක් සඳහා—

(අ) පැයකට වැඩි නොවන කාලසීමාවක් සඳහා ගාස්තුවක් නැත.

| | රු. | ශ. |
|---|---|---|
| (ආ) පැයකට වැඩි එහෙත් පැය 6කට වැඩි නොවන කාලසීමාවක් සඳහා ... | | .25 |
| (ඇ) පැය 6 කට වැඩි එහෙත් පැය 12 කට වැඩි නොවන කාලසීමාවක් සඳහා ... | | .50 |
| (ඇ) පැය 12 කට වැඩි එහෙත් පැය 24 කට වැඩි නොවන කාලසීමාවක් සඳහා ... | 1 | 00 |

2. රථය තබන තැනැත්තා තානායමේ නතර නොවී සිටින අවස්ථාවක, ගරාජයේ තබන සෑම මෝටර් රථයක්, මෝටර් බයිසිකලයක් හෝ වෙනත් රථවාහනයක් සඳහා—

| | රු. | ශ. |
|---|---|---|
| (අ) පැයකට වැඩි නොවන කාලසීමාවක් සඳහා ... | 1 | 00 |
| (ආ) පැයකට වැඩි එහෙත් පැය 6 කට වැඩි නොවන කාල සීමාවක් සඳහා ... | 1 | 25 |
| (ඇ) පැය 6 කට වැඩි එහෙත් පැය 12 කට වැඩි නොවන කාල සීමාවක් සඳහා ... | 1 | 50 |
| (ඇ) පැය 12 කට වැඩි එහෙත් පැය 24 කට අඩු කාලසීමාවක් සඳහා ... | 2 | 00 |

3. ගරාජයේ ඉඩ තිබියදී රාත්‍රි 8.00 සිට පසුදා පෙරවරු 6.00 දක්වා තානායම් භූමියේ තබන සෑම මෝටර් රථයක්, මෝටර් සයිකලයක් හෝ වෙනත් රථ වාහනයක් සඳහා—

(අ) පැය දෙකකට වැඩි නොවන කාල සීමාවක් සඳහා ... ...ගාස්තුවක් නැත.

| | රු. | ශ. |
|---|---|---|
| (ආ) පැය දෙකකට වැඩි එහෙත් පැය 6 කට වැඩි නොවන කාලසීමාවක් සඳහා ... | | .25 |
| (ඇ) පැය 6 කට වැඩි යම් කාලසීමාවක් සඳහා ... | | .50 |

### රාත්‍රී සේවාව

| | රු. | ශ. |
|---|---|---|
| රාත්‍රි 11.00 සිට පසුදා පෙරවරු 6.00 දක්වා කාලය අතර සංග්‍රහ කරනු ලබන එක් එක් තැනැත්තකු හෝ කණ්ඩායමක් සඳහා ... ... | 2 | 00 |

10–202—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 13 වැනි වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පණතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතේ 13(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලයේ ප්‍රකාර, ඌව කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් මුතුබන්ඩා සමරකෝන් වන මම, මොණරාගල දිස්ත්‍රික්කයේ බින්තැන්න දකුණ ගම්සභාවේ අංක 1 දරණ කොට්ඨාශයේ සභික තිසාහාමිගේ මුතුබණ්ඩා මහතා, පිළිවෙලින් පැවැත්වුනු ගම්සභා රැස්වීම් තුනකට වැඩිගණනකට සභාවට දැනුම්දීමක් නොකර නොපැමිණි බව ගැන සෑහීමට පත්වී, මොණරාගල දිස්ත්‍රික්කයේ බින්තැන්න දකුණ ගම්සභාවේ අංක 1 දරණ කොට්ඨාශයේ සභික තිසාහාමිගේ මුතුබන්ඩා මහතා, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට තම සභික ධූරය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ඌවේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

1966.9.24 දින,
බදුල්ලේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේදීය.

10–203—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

## ගම් සභා ආඥපනත

### 17 වැනි වගන්තිය යටතේ වූ දන්වීමයි

1961 අංක 60 දරණ පණතින් සංශෝධිත ගම් සභා ආඥපනතේ (257 වැනි අධිකාරිය) 17 (5) දරණ වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ඩොනල්ඩ් එඩ්මන්ඩ් අබේසිංහ වන මා විසින් මීට යාකොට ඇති උපලේඛනයේ I වැනි තීරුවෙන් නියමිත ගම් සභාවේ රැස්වීමක් එකී උපලේඛණයේ II වැනි තීරුවේ අනුරූප සටහනින් නියමිත දිනයේදීද, එකී උපලේඛණයේ III වැනි තීරුවේ අනුරූප සටහනින් නියමිත වේලාවේදීද, එකී උපලේඛණයේ IV වැනි තීරුවෙන් නියමිත ස්ථානයේදී ද මෙයින් කැඳවා සිටිනු ලැබේ.

ඩොනල්ඩ් අබේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
නුවරඑළිය.

1966 ඔක්තෝබර් මස 1 වැනි දින,
නුවරඑළිය, පළාත් පාලන කාර්යාලයේ දීය.

### උපලේඛනය

| I වැනි තීරුව ගම් සභාවේ නම | II වැනි තීරුව දිනය | III වැනි තීරුව වේලාව | IV වැනි තීරුව ස්ථානය |
|---|---|---|---|
| මැදපලාත ගම් සභාව ... ... | 1966.10.14 ... | පූ. භා. 11.00 ... | තෙරිපැහැ පිහිටි මැදපලාත ගම් සභා කාර්යාලයේදී |

10-307—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

**2 වැනි ශ්‍රේණියේ භාෂා පරිවර්තකයින්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—1966. 7. 17**

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අපේක්ෂකයින් 2 වැනි ශ්‍රේණියේ භාෂා පරිවර්තකයින්ගේ සේවයට (සිංහල) පත්කිරීම සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් තෝරා ගන්නා ලද බව මෙයින් දන්වනු ලැබේ.

| නම | ලිපිනය |
|---|---|
| (1) අදිකාරි, ඒ. පී. ඇන්. ... | 202, ශ්‍රී බෝධි පාර, ගම්පහ. |
| (2) අමරදාස, කේ. ඇන්. ඩී. ... | පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය, කොළඹ. |
| (3) ප්‍රනාන්දු, එච්. එම්. ජී. ... | 12/5, ටෙරන්ස් මාවත, ගල්කිස්ස. |
| (4) කරුණාරත්න, ඒ. (මෙනෙවිය) ... | 35, බගතලේ පාර, කොළඹ 3. |

මේම අපේක්ෂකයින්ට වහාම පත්වීම් ලබා දීමට කොමිෂන් සභාව භාරගනු නොලැබේ. පුරප්පාඩු ඇතිවූ විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

ඩබ්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

තැ. පෙ. 530,
කොළඹ, 1966 සැප්තැම්බර් මස 22 දින.

10–188—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

**පහළ ශ්‍රේණියේ සිංහල ලඝු ලේඛකයින්ගේ පත්වීම් ස්ථිර කිරීමේ විභාගය—1966 ජූලි**

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව කොළඹ නාගරික සභාවේ එම්. දයාවතී මෙනෙවිය "ලිපි ලිවීම" යන විෂයයෙන් සමත් වී ඇති බැව් මෙයින් දන්වනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1966 සැප්තැම්බර් මස 19 දින,
තැ. පෙ. 530, කොළඹ.

10–182—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

**I, II, III වැනි ශ්‍රේණිවල කර්මාන්ත හා ජලකර්මාන්ත අධිකාරින්ගේ, කොළඹ නාගරික සභාවේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පරීක්ෂක වරුන්ගේ, කොළඹ නාගරික සභාවේ ජලකර්මාන්ත හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරුන්ගේ හා අනිකුත් ප්‍රාදේශීය බලප්‍රමණ්ඩලවල ජලකර්මාන්ත පරීක්ෂකවරුන්ගේ කාර්‍ය්‍යක්ෂමතා කඩඉම් විභාගය**

ඉහත සඳහන් කාර්‍ය්‍යක්ෂමතා කඩඉම් විභාගය පිළිබඳව 66.8.5 දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පලකරන ලද දැන්වීමේ පළමුවැනි ඡේදය යටතේ පහත නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දී ඇති විෂයයන්ට පෙනී සිටීමෙන් නිදහස් කර ඇති බැව් මෙයින් දන්වනු ලැබේ :—

| නම | විෂයයන් |
|---|---|
| *1. ඒ. උදයරත්න, පරීක්ෂක, නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, කොළඹ නාගරික සභාව | (i) ප්‍රමාණ ගැනීම |
| *2. ඇන්. නඩරාජා, පරීක්ෂක, නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, කොළඹ නාගරික සභාව | (i) ත්‍රිකෝණමිතිය<br>(ii) මැනුම් හා මට්ටම් ගැනීම (පහළ ප්‍රායෝගික)<br>(iii) මැනුම් හා මට්ටම් ගැනීම (පහළ සිද්ධාන්ත)<br>(iv) ජලසම්පාදනය හා ජලාපවහනය<br>(v) ප්‍රමාණ ගැනීම |
| 3. ඩබ්ලිව්. ඩී. පෙරේරා, පරීක්ෂක, නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, කොළඹ නාගරික සභාව | (i) මැනුම් හා මට්ටම් ගැනීම (පහළ සිද්ධාන්ත)<br>(ii) මැනුම් හා මට්ටම් ගැනීම (පහළ ප්‍රායෝගික)<br>(iii) ගොඩනැගිලි ඉදිකිරීම |

* විභාගය සම්පූර්ණ කර ඇත.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1966 සැප්තැම්බර් මස 22 වැනි දින,
තැ. පෙ. 530,
කොළඹ :

10–197—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ජී.—බී. 134/46

---

ප.පා.දෙ—ජීසී. 55/1/29

## ගම්සභා ආඥාපනත

**පොල්පිතිගම ගම් සභාව**

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ගම්සභාව විසින් සම්පාදිතව ඒ වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966.9.20 මය වැනි දින කොළඹ දීය.

### වාහන හා සතුන් පිළිබඳ බද්දට අදාළ අතුරු ව්‍යවස්ථා

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ගම්සභාව විසින් සම්පාදිතව 1941 මැයි මස 16 වැනි දින අංක 8,746 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ වාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා, ඊට යාකොට ඇති උපලේඛනය වෙනුවට පහත සඳහන් උපලේඛනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

**උපලේඛනය**

| | |
|---|---|
| ගොන් දෙන්නා බඳින සෑම බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | පො.පි.ග.ස—ගො.දෙ.ක |
| තනිගොනා බඳින සෑම බරබාය කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | පො.පි.ග.ස—ත.ගො.ක. |
| සෑම බයිසිකලයක් සඳහා ... | පො.පි.ග.ස—පා.පැ. |
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින්රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... | පො.පි.ග.ස—වා. |
| සෑම ජින්රික්ෂෝ රථයක් සඳහා ... | පො.පි.ග.ස—ජී.රි. |
| සෑම අත්කරත්තයක් සඳහා .. | පො.පි.ග.ස.—අ.ක. |

තහඩුවල පාට සහ හැඩය සභාපති විසින් නිශ්චය කළ යුතුය.

10–213—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

# පළාත් පාලන සහා ජනද ආඥපණත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත

(262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ (262 වැනි අධිකාරය) 66(2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙළින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. එෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1966 සැප්තැම්බර් 26 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|
| **කළුතර දිස්ත්‍රික්කය** | | |
| **අදිකාරි පත්තු ගම්සභාව** | | |
| 10 | ... | පෙරේරා, හෙට්ටිගේ සිමියොන් |
| **මහනුවර දිස්ත්‍රික්කය** | | |
| **තෙල්දෙනිය සුළු නගර සභාව** | | |
| 4 | ... | යූනිස් ලෙබ්බෙ අබ්දුල් හසාන් |
| **මාතලේ දිස්ත්‍රික්කය** | | |
| **ගම්පහසිය පත්තු ගම්සභාව** | | |
| 10ඒ | ... | මිලිනා අළුවිහාරේ |
| **කුරුණෑගල දිස්ත්‍රික්කය** | | |
| **රම්බොඩගල්ල ගම්සභාව** | | |
| 7 | ... | සිංහල පෙලගේ රණසිංහ |
| **කෑගල්ල දිස්ත්‍රික්කය** | | |
| **අවුළුගම ගම්සභාව** | | |
| 19 | ... | රටගෙදර හේරත් මුදියන්සේලාගේ ලොකුබණ්ඩාර |
| **දෙහිගම්පල් කෝරළේ එගොඩපත පත්තු ගම්සභාව** | | |
| 26 | ... | තලන්තැනි රාල්ලාගේ ගුණරත්න |

7–210—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත

(262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ (262 වැනි අධිකාරය) 36 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙළින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. එෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1966 සැප්තැම්බර් 23 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| කොට්ඨාශ අංකය | අපේක්ෂකයාගේ නම |
|---|---|
| **කළුතර දිස්ත්‍රික්කය** | |
| **කළුතර බද්ද ගම් සභාව** | |
| 2 | මනිමෙල්දූර සෝමදාස පෙරේරා වික්‍රමරත්න |
| **වවුනියාව දිස්ත්‍රික්කය** | |
| **පුදුකුඩිඉරිප්පු ගම් සභාව** | |
| 5 | සෙබස්ටියම්පිල්ලේ ඥානප්‍රකාශම් |

7–209—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

# ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනය—කඳන සුළු නගර සභාව

### 1963 වර්ෂයේ ආදායම් හා වියදම් ලේඛණය

**ආදායම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම ... ... | 91,855 91 | |
| බී.—මහාමාර්ග ... ... | 3,264 53 | |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි ... | 86 0 | |
| ඩී.—මහජන සෞඛ්‍යය ... ... | 47,672 90 | |
| ඊ.—මහජන විනෝදය ... ... | 1,870 20 | |
| ඇෆ්.—සොහොන් බිම් ... ... | 160 0 | |
| | | 1,44,849 54 |
| **වෙනත් ලැබීම්** | | |
| 1. තැන්පත් ... ... | 64,552 45 | |
| 2. අත්තිකාරම් ... ... | 3,994 66 | |
| 3. විදුලිය ගිණුම ... ... | 2,01,650 62 | |
| 4. විවිධ ණය ගැතියෝ ... ... | 15,611 65 | |
| 5. ක්ෂය සංචිතය—විදුලිය ... | 1,000 0 | |
| 6. ආධාර මුදල් ... ... | 6,394 75 | |
| 7. විවිධ ණය හිමියෝ ... ... | 9,153 80 | |
| | | 2,72,357 13 |

**වියදම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... ... | 31,536 50 | |
| බී.—මහා මාර්ග ... ... | 41,683 16 | |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි ... | 2,356 8 | |
| ඩී.—මහජන සෞඛ්‍යය ... ... | 35,502 79 | |
| ඊ.—මහජන විනෝදය ... ... | — | |
| ඇෆ්.—සොහොන් බිම් ... ... | — | |
| | | 1,11,078 53 |
| **වෙනත් ගෙවීම්** | | |
| 1. තැන්පත් ... ... | 30,556 57 | |
| 2. අත්තිකාරම් ... ... | 7,987 50 | |
| 3. විවිධ ණය ගැතියෝ ... ... | 17,707 62 | |
| 4. විදුලිය ගිණුම ... ... | 1,51,257 98 | |
| 5. ආධාර මුදල් ... ... | 4,603 65 | |
| 6. විවිධ ණය හිමියෝ ... | 44,128 96 | |
| | | 2,56,242 28 |

| ආදයට එකතු කිරිමෙ ගිණුම | රු. ශ. | රු. ශ. | ආදයම් එකතු කිරීමේ ගිණුම | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|---|
| ඒ.—වරිපණම් බදු ... ... | 28,433 71 | | ඒ.—වරිපණම් බදු ... ... | 42,642 76 | |
| බී.—මලාපවහන ගාස්තු ... ... | 2,671 0 | | බී.—මලාපවහන ගාස්තු ... | 3,666 0 | |
| සී.—විදුලි ගාස්තු ... ... | 1,76,795 42 | | සී.—විදුලි ගාස්තු ... ... | 1,67,727 10 | |
| ඩී.—කුලී ... ... | 41,295 69 | | ඩී.—කුලී ... ... | 41,776 15 | |
| | | 2,49,195 82 | | | 2,55,812 01 |
| | | 6,66,403 29 | | | 6,23,132 82 |
| 1963 ජනවාරි 1 වැනි දින ශෙෂය ... | | 1,05,510 85 | 1963 දෙසැම්බර් 31 වැනි දිනට ශෙෂය ... | | 1,48,781 32 |
| | | 7,71,914 14 | | | 7,71,914 14 |

කදාන සුළු නගර සභාවේ සභාපති, ජෙරාඩ් බෙනඩික් හල්පෙ වන මම, ඉහත සඳහන් 1963 දෙසැම්බර් 31 වැනි දිනට දක්වෙන කදාන සුළු නගර සභාවේ ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය, මගේ දැනීමේ හා විශ්වාසයේ අන්දමට සත්‍ය හා නිවැරදි ප්‍රකාශයක් බව මෙයින් සහතික කරමි.

ජෙරාඩ් බී. හල්පෙ,
සභාපති, කදාන සුළු නගර සභාව.

නිවැරදි බවට සහතික කරමි.
වෙලස්පර් පෙරේරා,
සාමාජික, කදාන සුළු නගර සභාව.

1966 මාර්තු මස 30 වැනි දින මා ඉදිරිපිට ජාඇලදී සහතික කරන ලදී.

ඇලොයි වාස්
සමාදන විනිශ්චයකාර තුමා.

## 1963 දෙසැම්බර් 31 වැනි දිනට වත්කම් හා බැරකම් ලේඛනය—කදන සුළු නගර සභාව

**බැරකම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත් මුදල් ... ... | | | 61,321 58 |
| විදුලිය දෙපාර්තමේන්තුවේ ක්ෂය සංචිතය | | | 1,000 0 |
| රජයේ ආධාර— | | | |
| මුඩුක්කු සංහාරක යෝජනා ක්‍රමය ... | | 20,000 0 | |
| ක්‍රීඩා භූමි ... ... | | 15,000 0 | |
| ප්‍රජා මංඩල ... ... | | 557 0 | |
| කායඹාලිය උපකරණ ... ... | | 859 87 | |
| මංමාවත් ... ... | | 24 0 | |
| පැතිකාණු ... ... | | 1,445 50 | |
| කියවීම් ශාලා ... ... | | 1,000 0 | |
| | | | 38,886 37 |
| විවිධ ණය හිමියෝ ... ... | | | 9,180 65 |
| අති රික්තය සාමාන්‍ය— | | | |
| 1962.12.31 දිනට අධිකය ... | | 61,728 30 | |
| | රු. ශ. | | |
| 1963 වර්ෂයේ ලැබීම් ... | 1,44,849 54 | | |
| 1963 වර්ෂයේ ගෙවීම් ... | 1,11,078 53... | 33,771 01 | |
| | | | 95,499 31 |
| විදුලිය දෙපාර්තමේන්තුව— | | | |
| 1962.12.31 දිනට අධිකය ... | | 23,800 79 | |
| 1963 වර්ෂයේ ලැබීම් ... | 2,01,650 62 | | |
| 1963 වර්ෂයේ ගෙවීම් ... | 1,51,257 98 | | |
| | | 50,392 64 | |
| | | | 74,193 43 |
| | | | 2,80,081 34 |

**වත්කම්**

| | රු. ශ. |
|---|---|
| වරිපනම් බදු මුදල් ... ... ... | 51,233 03 |
| කසළ ශෝධන ගාස්තු ... ... | 2,065 0 |
| කුලී ... ... ... | 2,005 71 |
| අත්තිකාරම් ... ... ... | 5,137 78 |
| විදුලිය ගාස්තු ... ... ... | 50,831 17 |
| විවිධ ණය ගැතියෝ ... ... ... | 20,027 33 |
| මුදල් ... ... ... | 1,48,781 32 |
| | 2,80,081 34 |

කදාන සුළු නගර සභාවේ සභාපති, ජෙරාඩ් බෙනඩික් හල්පෙ වන මම, ඉහත සඳහන් 1963 දෙසැම්බර් 31 වැනි දිනට දක්වෙන සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් ප්‍රකාශය මගේ දැනීමේ හා විශ්වාසයේ අන්දමට සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

ජෙරාඩ් බී. හල්පෙ,
සභාපති,
කදාන සුළු නගර සභාව.

නිවැරදි බවට සහතික කරමි.
වෙලස්පර් පෙරේරා
සාමාජික,
කදාන සුළු නගර සභාව.

1966 මාර්තු 30 වැනි දින මා ඉදිරිපිට ජාඇලදී සහතික කරන ලදී.

ඇලොයි වාස්,
සමාදන විනිශ්චයකාර තුමා.

10-201—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

## තිස්සමහාරාම සුළු නගර සභාව

### 1964 වර්ෂයේ ආදායම් සහ වියදම් ලේඛනය

**ආදායම**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම ... ... | 76,843 89 | |
| බී.—මංමාවත් ... ... | 1,248 0 | |
| සී.—ඉඩම් හා ගොඩනැගිලි ... ... | 76 25 | |
| ඩී.—මහජන සෞඛ්‍ය ... ... | 44,305 75 | |
| ඊ.—මහජන විනෝදය ... ... | 6,824 0 | |
| එෆ්.—සොහොන් භූමි ... ... | — | |
| ජී.—සුනඛයින් ලියාපදිංචි කිරීම ... | 29 0 | |
| එච්.—කිරුම් හා මිනුම් ... ... | — | |
| අයි.—ගිණි ආරක්ෂා ... ... | — | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල ... | — | |
| | | 1,29,326 89 |
| **වෙනත් ලැබීම්** | | |
| 1. තැන්පත් ... ... | 11,073 41 | |
| 2. අත්තිකාරම් ... ... | 5,489 25 | |
| 3. විවිධ ණය හිමියෝ ... ... | 4,768 98 | |
| 4. විදුලි ගිණුම් ... ... | 68,336 08 | |
| 5. අගය අඩුවීම—විදුලි දෙපාර්තමේන්තුව ... | 1,500 0 | |
| 6. විවිධ ණයගැතියෝ ... ... | 9,300 35 | |
| 7. ආදායම් එකතුවේ ගණුදෙනු— | | |
| ඒ.—දේපල බදු ... ... | 19,900 29 | |
| බී.—ජල බද්ද ... ... | 9,171 18 | |
| සී.—වැසිකිලි ගාස්තු ... ... | 3,807 0 | |
| ඩී.—කඩ බදු ... ... | 6,976 50 | |
| ඊ.—දේපල වරෙන්තු ගාස්තු ... | 677 40 | |
| එෆ්.—විදුලි ගාස්තු ... ... | 45,271 35 | |
| | | 1,86,271 79 |
| | | 3,15,598 68 |
| 1963.12.31 ඉතිරි ... ... | | 55,276 19 |
| | | 3,70,874 87 |

**වියදම**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... ... | 27,485 91 | |
| බී.—මංමාවත් ... ... | 27,986 07 | |
| සී.—ඉඩම් හා ගොඩනැගිලි ... | 2,269 20 | |
| ඩී.—මහජන සෞඛ්‍ය ... ... | 58,182 05 | |
| ඊ. මහජන විනෝදය ... ... | 351 50 | |
| එෆ්.—සොහොන් භූමි ... ... | — | |
| ජී.—සුනඛයින් ලියාපදිංචි කිරීම ... | 181 50 | |
| එච්.—කිරුම් හා මිනුම් ... ... | — | |
| අයි.—ගිණි ආරක්ෂා ... ... | — | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල ... | — | |
| | | 1,16,456 23 |
| **වෙනත් ගෙවීම්** | | |
| 1. තැන්පත් ... ... | 11,652 40 | |
| 2. අත්තිකාරම් ... ... | 5,811 80 | |
| 3. විවිධ ණය හිමියෝ ... ... | 1,101 82 | |
| 4. විදුලි ගිණුම් ... ... | 64,165 96 | |
| 5. අගය අඩුවීම—විදුලි දෙපාර්තමේන්තුව ... | — | |
| 6. විවිධ ණය ගැතියෝ ... ... | 16,574 48 | |
| 7. ආදායම් එකතුවේ ගණුදෙනු— | | |
| ඒ.—දේපල බදු ... ... | 16,752 80 | |
| බී.—ජල බද්ද ... ... | 8,349 61 | |
| සී.—වැසිකිලි ගාස්තු ... ... | 3,746 0 | |
| ඩී.—කඩබදු ... ... | 7,620 0 | |
| ඊ.—දේපල වරෙන්තු ගාස්තු ... | 926 64 | |
| එෆ්.—විදුලි ගාස්තු ... ... | 48,420 78 | |
| | | 1,85,122 29 |
| 1964.12.31 ඉතිරි ... | | 69,296 35 |
| | | 3,70,874 87 |

තිස්සමහාරාම නගරයේ විශේෂ කොමසාරිස් වන හෙට්ටි ආරච්චිගේ පියදස අබේවර්ධන වන මම, ඉහත සඳහන් වාර්තාව, මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1964 වර්ෂයේ තිස්සමහාරාම සුළු නගර සභාවේ ලැබීම් සහ ගෙවීම් පිළිබඳ නිවැරදිවූත්, සත්‍යවූත් වාර්තාවක් බව සහතික කරමි.

නිවැරදි බවට සහතික කරන ලදී.
ඩී. වී. ජයසිංහ,
ලේකම්, තිස්සමහාරාම නගරය.

එච්. ඒ. පී. අබේවර්ධන,
විශේෂ කොමසාරිස්, තිස්සමහාරාම නගරය.

1966 ජූලි මස 6 දින මා ඉදිරිපිට තිස්සමහාරාමයේදී සහතික කරන ලදී.

ඊ. ජයසිංහ,
සමාදාන විනිශ්චයකාර තැන, තිස්සමහාරාමය.

## තිස්සමහාරාම සුළු නගර සභාව

### 1964 දෙසැම්බර් 31 දින ශේෂ පත්‍රය

**බැරකම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත්—රජයේ ආධාර : | | | |
| නිවාස යෝජනා ක්‍රමය ... | | 16,500 0 | |
| සාමාන්‍ය තැන්පත් ... | | 20,396 57 | |
| | | | 36,896 57 |
| විවිධ ණය හිමියෝ ... ... | | | 4,768 98 |
| විදුලි දෙපාර්. අගය අඩුවීමේ සංචිතය ... | | | 3,950 0 |
| සාමාන්‍ය අධිකතා/ඌනතා ... ... | | 37,717 45 | |
| 1964.1.1 දිනට අධිකය ... ... | | — | |
| 1964.12.31 දිනට අය ... | 1,29,326 89 | | |
| එම වැය ... | 1,16,456 23 | | |
| | | 12,870 66 | 50,588 11 |
| විදුලි දෙපාර්ත. අධිකතා/ඌනතා : | | | |
| 1964.1.1 දිනට අධිකය ... ... | | 19,175 18 | |
| 1964.12.31 දිනට අය ... | 68,336 08 | | |
| එම වැය ... | 64,165 96 | | |
| | | 4,170 12 | 23,345 30 |
| | | | 1,19,548 96 |

**වත්කම්**

| | රු. ශ. |
|---|---|
| අත්තිකාරම් ... ... ... | 1,988 82 |
| දේපල බදු ... ... ... | 15,354 81 |
| ජල බද්ද ... ... ... | 7,411 80 |
| වැසිකිලි ගාස්තු ... ... ... | 991 0 |
| කඩබදු ... ... ... | 962 50 |
| විදුලි ගාස්තු ... ... ... | 6,541 51 |
| දේපල බදු දඩ ගාස්තු ... ... ... | 427 69 |
| විවිධ ණය ගැතියෝ ... ... ... | 16,574 48 |
| 1964.12.31 මුදල් පොතේ ශේෂය ... ... | 69,296 35 |
| | 1,19,548 96 |

තිස්සමහාරාම නගරයේ විශේෂ කොමසාරිස්වන හෙට්ටි ආරච්චිගේ පියදස අබේවර්ධන වන මම, ඉහත සඳහන් වාර්තාව, මාගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1964 දෙසැම්බර් 31 වෙනිද වන විට, තිස්සමහාරාම සුළු නගර සභාවේ වත්කම් සහ බැරකම් පිළිබඳ නිවැරදි වූත්, සත්‍යවූත්, වාර්තාවක් බවට මෙයින් සහතික කරමි.

නිවැරදි බවට සහතික කරන ලදී.
ඩී. වී. ජයසිංහ,
ලේකම්, තිස්සමහාරාම නගරය.

එච්. ඒ. පී. අබේවර්ධන,
විශේෂ කොමසාරිස්, තිස්සමහාරාම නගරය.

1966 ජූලි මස 6 වන දින මා ඉදිරිපිට තිස්සමහාරාමයේදී සහතික කරන ලදී.

ඊ. ජයසිංහ,
සමාදාන විනිශ්චයකාර තැන, තිස්සමහාරාමය.

10-206/1—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

## තිස්සමහාරාම සුළු නගර සභාව

### ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනය

### 1965 වර්ෂයේ ආදායම් හා වියදම් ලේඛනය

| ආදායම | රු. ශ | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම ... | ... 90,239 72 | |
| බී.—මංමාවත් ... | ... 1,296 0 | |
| සී.—නගරසභා ඉඩම් සහ ගොඩනැගිලි | ... 362 75 | |
| ඩී.—මහජන සෞඛ්‍යය ... | ... 39,891 68 | |
| ඊ.—මහජන විනෝදය ... | ... 6,357 35 | |
| එෆ්.—සුසාන භූමි ... | ... — | |
| ජී.—සුනඛ ලියාපදිංචිය ... | ... 10 0 | |
| එච්.—කිරුම් හා ගිණුම් ... | ... — | |
| අයි.—ගින්නෙන් ආරක්ෂා කිරීම | ... — | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල | ... — | |
| | | 1,38,157 50 |
| **වෙනත් ලැබීම්** | | |
| 1. තැන්පත් ... | ... 13,382 24 | |
| 2. අත්තිකාරම් ... | ... 6,823 98 | |
| 3. විවිධ ණය හිමියෝ ... | ... 17,170 44 | |
| 4. විදුලි ගිණුම ... | ... 70,053 52 | |
| 5. විවිධ ණය ගැතියෝ ... | ... 16,574 48 | |
| 6. විදුලි දෙපාර්තමේන්තුවේ අගය අඩුවීමේ සංචිතය ... | ... 1,750 0 | |
| 7. අධිකතා/ඌනතා සාමාන්‍ය | ... 49 42 | |
| 8. ආදායම් එකතු කිරීමේ ගිණුම්— | | |
| ඒ.—දේපල බදු ... | ... 17,176 50 | |
| බී.—වතුර බදු ... | ... 7,597 37 | |
| සී.—වර්චස් ශෝධන ගාස්තු | ... 3,150 0 | |
| ඩී.—කුලී ... | ... 7,160 0 | |
| ඊ.—වරිපනම් දඩ මුදල් | ... 798 0 | |
| එෆ්.—විදුලි බල ගාස්තු | ... 47,357 99 | |
| | | 2,09,043 94 |
| | | 3,47,201 44 |
| 1964–12–31 දිනට ඉතිරිය ... | | 69,296 35 |
| | | 4,16,497 79 |

| වියදම | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... | ... 27,042 04 | |
| බී.—මංමාවත් ... | ... 16,161 98 | |
| සී.—නගරසභා ඉඩම් සහ ගොඩනැගිලි | ... 1,660 41 | |
| ඩී.—මහජන සෞඛ්‍යය ... | ... 60,270 28 | |
| ඊ.—මහජන විනෝදය ... | ... 552 0 | |
| එෆ්.—සුසාන භූමි ... | ... — | |
| ජී.—සුනඛ ලියාපදිංචිය ... | ... 593 45 | |
| එච්.—කිරුම් හා ගිණුම් ... | ... — | |
| අයි.—ගින්නෙන් ආරක්ෂා කිරීම | ... — | |
| ජේ.—කියවීම් ශාලා සහ පුස්තකාල | ... — | |
| | | 1,06,280 16 |
| **වෙනත් ගෙවීම්** | | |
| 1. තැන්පත් ... | ... 11,424 13 | |
| 2. අත්තිකාරම් ... | ... 6,849 16 | |
| 3. විවිධ ණය ගැතියෝ ... | ... 27,225 82 | |
| 4. විදුලි ගිණුම ... | ... 62,731 90 | |
| 5. විවිධ ණය හිමියෝ ... | ... 4,768 98 | |
| 6. අධිකතා/ඌනතා සාමාන්‍ය | ... 49 35 | |
| 7. ආදායම් එකතු කිරීමේ ගිණුම්— | | |
| ඒ.—දේපල බදු | ... 23,572 22 | |
| බී.—වතුර බදු ... | ... 6,539 38 | |
| සී.—වර්චස් ශෝධන ගාස්තු | ... 3,710 0 | |
| ඩී.—කුලී ... | ... 7,620 0 | |
| ඊ.—වරිපනම් දඩ මුදල් | ... 1,644 07 | |
| එෆ්.—විදුලි බල ගාස්තු | ... 47,886 23 | |
| | | 2,04,021 24 |
| | | 3,10,301 40 |
| 1965–12–31 දිනට ඉතිරිය ... | | 1,06,196 39 |
| | | 4,16,497 79 |

තිස්සමහාරාම නගරයේ විශේෂ කොමසාරිස් වන හෙට්ටි ආරච්චිගේ පියදස අබේවර්ධන වන මම, ඉහත සඳහන් වාර්තාව, මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1965 වර්ෂයේ තිස්සමහාරාම සුළු නගර සභාවේ ලැබීම් හා ගෙවීම් පිළිබඳ නිවැරදිවූත්, සත්‍යවූත් වාර්තාවක් බව සහතික කරමි.

එච්. ඒ. පී. අබේවර්ධන,
විශේෂ කොමසාරිස්, තිස්සමහාරාම නගරය.

නිවැරදි බවට සහතික කරන ලදී.
ඩී. ටී. ජයසිංහ,
ලේකම්, තිස්සමහාරාම නගරය.

1966 ක් වූ ජූලි මස 6 වැනි දින මා ඉදිරිපිට තිස්සමහාරාමයේදී සහතික කරන ලදී.

ටී. ජයසිංහ,
සමාදාන විනිශ්චයකාරතැන, තිස්සමහාරාමය.

## තිස්සමහාරාම සුළු නගර සභාව

### 1965 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂ පත්‍රය

| බැරකම් | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත්—රජයේ ආධාර (නිවාස යෝජනා ක්‍රමය) ... | | ... 16,500 0 | |
| රජයේ ආධාර (කාණු ඉදිකිරීම) | | ... 1,000 0 | |
| සාමාන්‍ය තැන්පත් | | ... 21,354 68 | |
| | | | 38,854 68 |
| විවිධ ණය හිමියෝ ... ... | | ... | 17,170 44 |
| අගය අඩුවීමේ සංචිතය—විදුලි දෙපාර්තමේන්තුව | | ... | 5,700 0 |
| සාමාන්‍ය අධිකතා/ඌනතා : | | | |
| 1965–1–1 වැනි දිනට අධිකය | ... 50,588 11 | | |
| සකස් කිරීම (එකතුකළා) | ... 49 42 | | |
| | 50,637 53 | | |
| සකස් කිරීම (අඩුකළා) ... | 49 35 | | |
| | | 50,588 18 | |
| 1965–12–31 දිනට අය ... | 1,38,157 50 | | |
| 1965–12–31 දිනට වැය ... | 1,06,280 16 | | |
| | | 31,877 34 | |
| | | | 82,465 52 |
| විදුලි දෙපාර්තමේන්තුව—අධිකතා/ඌනතා : | | | |
| 1965–12–31 වැනි දිනට අධිකය | | ... 23,345 30 | |
| 1965–12–31 දිනට අය | ... 70,053 52 | | |
| 1965–12–31 දිනට වැය | ... 62,731 90 | | |
| | | 7,321 62 | |
| | | | 30,666 92 |
| | | | 1,74,857 56 |

| වත්කම් | රු. ශ. |
|---|---|
| අත්තිකාරම් ... ... ... | 2,014 0 |
| දේපල බදු ... ... ... | 21,750 53 |
| ජල බදු ... ... ... | 6,353 81 |
| වැසිකිළි ගාස්තු ... ... ... | 1,551 0 |
| කඩ බදු ... ... ... | 1,422 50 |
| විදුලි ගාස්තු ... ... ... | 7,069 75 |
| වරෙන්තු ගාස්තු ... ... ... | 1,273 76 |
| විවිධ ණය ගැතියෝ ... ... ... | 27,225 82 |
| 1965–12–31 වැනි දිනට මුදල් පොතේ ශේෂය ... | 1,06,196 39 |
| | 1,74,857 56 |

තිස්සමහාරාම නගරයේ විශේෂ කොමසාරිස් වන හෙට්ටි ආරච්චිගේ පියදස අබේවර්ධන වන මම, ඉහත සඳහන් වාර්තාව, මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1965 දෙසැම්බර් 31 වෙනිදා වන විට, තිස්සමහාරාම සුළු නගර සභාවේ වත්කම් සහ බැරකම් පිළිබඳ නිවැරදිවූත්, යථාවූත් වාර්තාවක් බවට මෙයින් සහතික කරමි.

එච්. ජී. පී. අබේවර්ධන,
විශේෂ කොමසාරිස්, තිස්සමහාරාම නගරය.

නිවැරදි බවට සහතික කරන ලදී.

ඩී. ටී. ජයසිංහ,
ලේකම්, තිස්සමහාරාම නගරය.

1966 ක් වූ ජූලි මස 6 වැනි දින මා ඉදිරිපිට තිස්සමහාරාමයේදී සහතික කරන ලදී.

ටී. ජයසිංහ,
සමාදාන විනිශ්චයකාර තැන, තිස්සමහාරාමය.

10–206/2—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

# අය-වැය ලේඛන

## හපුතලේ නගර සභාව

**1966 වර්ෂයේ පස්වන පරිපූරක අයවැය ලේඛනය**

| වැය ශීර්ෂය | මුදල රු. ශ. | යෝජනා අංකය හා දිනය |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම :— | | |
| (2) කාර්‍ය මණ්ඩලීය වියදම්— | | |
| (ඊ) නීති කටයුතු පිළිබඳ වියදම් | 225 0... | 1966.9.22 දින අංක 9 දරණ යෝජනාව |
| ඊ.—මහජන සනීපාරක්ෂාව :— | | |
| (5) ජලසම්පාදනය— | | |
| (සී) නඩත්තු කිරීම ... | 7,000 0... | 1966.9.22 දින අංක 11 දරණ යෝජනාව |
| ඊ.—මහජන සනීපාරක්ෂාව :— | | |
| (5) ජලසම්පාදනය— | | |
| (බී) ගබඩා ... ... | 1,000 0... | 1966.9.22 දින අංක 12 දරණ යෝජනාව |
| ඒ.—සාමාන්‍ය වියදම :— | | |
| (2) කාර්‍ය මණ්ඩලීය වියදම්— | | |
| (ජේ) නිවාඩු දුම්රිය ප්‍රවේශ පත්‍ර | 500 0... | 1966.9.22 දින අංක 15 දරණ යෝජනාව |

ඇම්. එච්. සමයදස,
හපුතලේ නගර සභාපති.

1966.9.26 වැනි දින,
හපුතලේ නගර සභා කාර්‍යාලයේදිය.

10–180—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

## පොළොන්නරුව සුළු නගර සභාව

**1966 අයවැය ලේඛනය**

### මුදල් නියෝග 40 (II) යටතේ කෙරෙන අයදුම් පත

1966 අය වැය ලේඛනයේ වෙන් කරන ලද මුදල් පහත සඳහන් පරිදි ශීර්ෂවලට මාරු කිරීම 66.8.25 දින මාසික සභා රැස්වීමේ දී අංක 4 ඊ. දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

| ඉතිරි මුදල් වැය ශීර්ෂය | රු. ශ. | මුදල් අවශ්‍ය වැය ශීර්ෂය | රු. ශ. |
|---|---|---|---|
| විදුලි අංශය : | | | |
| 2ඒ. ගොඩනැගිලි ... | 2,500 0 | සී. 7 නව කර්මාන්ත ... | 2,500 0 |

අනුමත කරමි.

කේ. වල්ගමගේ,
ප. පා. ස. කොමසාරිස්තුමා,
අනුරාධපුරය.

පළාත් පාලන කාර්‍යාලය,
අනුරාධපුරය, 1966 සැප්තැම්බර් 24 දින.

10–204—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

## වේයන්ගොඩ සුළු නගර සභාව

**1966 වර්ෂයේ සතරවෙනි පරිපූරක වැය ලේඛනය**

සාමාන්‍ය අංශය

| | | රු. ශ. |
|---|---|---|
| ඩී. 2 බී ගොන් කරත්ත සහ ලොරි | ... | 1,750 0 |
| ඩී. 3 බී ගොන් කරත්ත සහ ලොරි | ... | 1,750 0 |
| | | 3,500 0 |

විදුලි අංශය

| | | රු. ශ. |
|---|---|---|
| ඊ.ඇල්. 2 බී විදුලිය බලය සපයන හා සම්ප්‍රේෂණ මාර්ග නඩත්තුව | ... | 10,000 00 |

වර්ෂ 1966ක් වූ සැප්තැම්බර් මස 8 වෙනි දින පැවැත්වූ විශේෂ සභා රැස්වීමේදී අංක 2 දරණ යෝජනාවෙන් සභා සම්මත කර ගන්නා ලදී.

ජී. ඒ. ඩී. ඇල්. තිලකරත්න,
වේයන්ගොඩ සුළු නගර සභාවේ සභාපති.

10–212—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

## ගම්පහ නගර සභාව

**නිවැරදි කිරීමක්**

1965 දෙසැම්බර් මස 17 දින අංක 14,587 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ හතරවැනි කොටසේ 1088 වැනි පිටුවෙහි ප්‍රකාශයට පත් කර ඇති ගම්පහ නගර සභාවේ 1966යේ අය වැය ලේඛනයේ " ජී සොහොන් බිම් (3) ඉදි කිරීම් " වැය සිරස යටතේ සඳහන් වී ඇති රු. 3,000 එම වැය සිරස යටතට නොව, " ජී සොහොන් බිම් (4) ජීවනාධාර දීමනා " වැය සිරස යටතට සඳහන් වීමෙන් නිවැරදි විය යුතුය.

ඩී. ජී. වීරතුංග,
ගම්පහ නගර සභාවේ සභාපති.

නගර සභා කාර්යාලය,
ගම්පහ, 66.9.24.

10–208—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

## පැල්මඩුල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි 40(II) වැන්න යටතේ අයදුම් පත

1966 වර්ෂයේ අය වැය ලේඛනයේ ඒ ඒ වැය ශීර්ෂ යටතේ වෙන් කරන ලද මුදල්වලින් ඉතුරු වේ යයි ගණන් බලා පහත සඳහන් ශීර්ෂ යටතේ පෙන්වා ඇති මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරු කිරීමට අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා ඒ ඒ වැය ශීර්ෂ යටතේ යෙදීම 1966 අගෝස්තු මස 25 වෙනි දින පැවැත්වූ සභා රැස්වීමේ අංක 6 දරණ සම්මුතියෙන් සභා සම්මත විය.

| ඉතිරි කිරීමේ වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් : | | |
| 2. සංස්ථා වියදම්— | | |
| (අයි) නිවාඩු දුම්රිය බලපත්‍ර ගාස්තු ... ... | 500 | 0 |
| බී.—මංමාවත් : | | |
| 7. ඉඩම් අත්පත් කර ගැනීම ... ... | 500 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍ය : | | |
| 1. සාමාන්‍ය— | | |
| (එච්) කාණු ඉදිකිරීම ... ... | 400 | 0 |
| 3. වැසිකිළි ශොධනය— | | |
| (ඊ) ඉදිකිරීම ... ... ... | 1,500 | 0 |
| | 2,900 | 0 |

| අවශ්‍යව ඇති වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් : | | |
| 2. සංස්ථා වියදම්— | | |
| (ජේ) හදිසි වියදම් ... ... ... | 200 | 0 |
| සී.—නගර සභා ඉඩම්, ගොඩනැගිලි : | | |
| 1. වැටුප් ... ... ... | 100 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍ය : | | |
| 1. සාමාන්‍ය— | | |
| (ඒ) වැටුප් (සෞඛ්‍ය ඕවර්සියර්) ... ... | 150 | 0 |
| (ඇන්) මාතෘ දරකාභිවෘධි මධ්‍යස්ථාන ... | 250 | 0 |
| (ඕ) ජීවනාධාර ... ... ... | 150 | 0 |
| 2. කැළි කශල ශොධනය— | | |
| (බී) කරත්ත, ගොන් හා ලොරි ... ... | 200 | 0 |
| 3. වැසිකිළි ශොධනය— | | |
| (බී) කරත්ත, ගොන් හා ලොරි ... ... | 400 | 0 |
| 5. ජල සම්පාදනය— | | |
| (ඊ) ඉදිකිරීම ... ... ... | 1,250 | 0 |
| 7. පොදු වෙළඳ පොලවල් හා ගාල්— | | |
| (ඩී) ඉදිකිරීම ... ... ... | 200 | 0 |
| | 2,900 | 0 |

1966 අගෝස්තු මස 29 වෙනි දින,
පැල්මඩුල්ලේදීය.

ඒ. සී. ඇම්. ඒ. මරික්කාර්,
පැල්මඩුල්ල සුළු නගර සභාවේ සභාපති.

අනුමත කරමි.

1966.9.19 දින, රත්නපුර,
පළාත් පාලන කාර්යාලයේදීය.

ඇල්. ජී. සිරිවර්ධන,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
සබරගමු පෙදෙස.

10–199—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

## පොල්ගහවෙල සුළු නගර සභාව

### 1966 වර්ෂයේ තුන් වැනි අතුරු අයවැය ලේඛනය

### 1 වැනි කොටස—සාමාන්‍ය

| | | රු. | ශ. |
|---|---|---|---|
| කාර්යාලීය වියදම් : | | | |
| ඒ. 2 (බී) | ගමන් ගාස්තු ... ... | 800 | 0 |
| ඒ. 2 (ජේ) | හදිසි වියදම් ... ... | 100 | 0 |
| ඒ. 2 (කේ) | කාර්යාලීය භාණ්ඩ ... ... | 100 | 0 |
| සභා ගොඩනැගිලි සහ ඉඩම් : | | | |
| සී. 8 | ජීවනාධාර ... ... ... | 50 | 0 |
| කුණු කසළ ශෝධනය : | | | |
| ඩී. 2 (බී) | කරත්ත, ගොන් සහ ලොරි ... ... | 500 | 0 |
| වැසිකිළි ශෝධනය : | | | |
| ඩී. 3 (බී) | කරත්ත, ගොන් සහ ලොරි ... ... | 500 | 0 |
| ජලය සැපයීම : | | | |
| ඩී. 5 (සී) | නඩත්තුව ... ... ... | 200 | 0 |
| ආරෝග්‍ය ශාලා : | | | |
| ඩී. 6 (බී) | නඩත්තුව ... ... ... | 1,200 | 0 |
| ප්‍රසිද්ධ වෙළඳ සැල් හා ගාල් : | | | |
| ඩී. 7 (බී) | නඩත්තුව ... ... ... | 350 | 0 |
| | | 3,800 | 0 |

1966 ක්වූ සැප්තැම්බර් මස 15 වැනි දින පවත්වන ලද විශේෂ රැස්වීමේ අංක 4 දරණ යෝජනාවෙන් සභා සම්මත කරන ලදී.

ආර්. ඒ. සිරිසේන,
සභාපති,
සුළු නගර සභාව, පොල්ගහවෙල.

සුළු නගර සභා කාර්යාලය,
පොල්ගහවෙල, 1966.9.23.

10–186—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## මීරිගම සුළු නගර සභාව

### සුළු නගරසභා ආඥාපනත

### 1967 වර්ෂයට දේපල බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය) යටතේ, ගතවී යන මෙම වර්ෂයට බලපැවත්වූ පහත සඳහන් දේපල බදු 1967 වර්ෂයටද එලෙසම පැණවීමටද මීරිගම සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරණු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන (කුඹුරු හැර) සියළුම නිශ්චල දේපලවල වටිනාකමින් සියයට පහ බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදයින්, ජූනි 30 වැනිදයින්, සැප්තැම්බර් 30 වැනිදයින් සහ දෙසැම්බර් 31 වැනිදායින් අවසන්වන අයුරු කාර්තු වශයෙන් ගෙවිය හැකි වේ.

ජේ. ථී. අමරතුංග,
මීරිගම සුළු නගර සභාවේ සභාපති තැන.

1966 ක්වූ සැප්තැම්බර් මස 23 වැනි දින,
මීරිගම සුළු නගර සභා කාර්යාලයේදීය.

10–193—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

## 261 වැනි අධිකාරිය වන පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරියේ) 3 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ අපරැක්ක-බඹරැන්ද ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

(අ) පළාත් පාලන ඇමැතිතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරන ගැසැට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ, 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරන ගැසට් පත්‍රයේ පළ වූ නිවේදන යෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූවා වූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වාවූ කාණ්ඩ, සහ

(ආ) එකී ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබූ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ, 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරන ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පමුණුවනු ලැබූවා වූ එකී අතුරු ව්‍යවස්ථා මාලාවේම අංක 38 දරණ කාණ්ඩයද,

මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළ වූ දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්මත කරගැනීම සඳහා දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ අපරැක්ක-බඹරැන්ද ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරියේ) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

පියසේන අලහප්පෙරුම,
අපරැක්ක-බඹරැන්ද ගම් සභාවේ සභාපති.

3.9.66.
ගම්සභා කාර්යාලය,
පාතේගම,
කෝට්ටගොඩ.

10–198—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

## මීරිගම සුළු නගර සභාව

### 1967 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

### 256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥපනත

මීරිගම සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) 256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත උපලේඛණයේ විස්තර වන ගණන් අනුව, 1967 වර්ෂයට රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා අයකිරීමටද,

(2) එකී ආඥ පණතේ 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1967 මාර්තු මස 31 වැනිදාට හෝ ඊට පෙර ගෙවිය හැකිවිය අයුරින් ද වේ.

#### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදතුනයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත්කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදතුනයේ පාපැදි, හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... ... | 5 | 0 |
| සෑම පාපැදියක්, රෝදතුනයේ පාපැදියක්, හෝ පාපැදි මෝටර් රථයක්, හෝ කරත්තයක්, රෝදතුනයේ පාපැදි මෝටර් රථයක් හෝ පාපැදි කරත්තයක් | 1 | 0 |
| ගොන් දෙන්නා බඳින සෑම බරකරත්තයක් හෝ තිරික් කලයක් සඳහා ... ... | 4 | 0 |
| තනි ගොනා බඳින සෑම බරබාගයක් හෝ තිරික් කලයක් සඳහා ... ... ... | 2 | 50 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයකුට හා සෑම කොටළුවකුටම ... | 2 | 50 |
| සෑම අශ්වතරයෙකුටම හෝ බූරුවෙකුටම ... | 2 | 50 |
| සෑම ඇතෙකුට, අලියෙකුට හෝ ඇතින්නියකුටම ... | 10 | 0 |

ජේ. ඊ. අමරතුංග,
මීරිගම සුළු නගර සභාවේ සභාපති තැන.

1966 සැප්තැම්බර් මස 23 වැනි දින,
මීරිගම සුළු නගර සභා කාර්යාලයේ දීය.

10–191—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

## මීරිගම සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥ පනත

### 1967 වර්ෂය සඳහා කසල සෝධන වරිපනම් බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතෙහි 129(ආ) වෙනි වගන්තිය යටතේ සහ එකී වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති තුමා විසින් දෙන ලද අනුමැතිය ඇතිව, සභාව විසින් නියම කළ හැකි සීමා කිරීම්, විශේෂයන් හා කොන්දේසිවලට යටත්ව, මීරිගම නගරය තුළ පිහිටා තිබෙන මෙහි උපලේඛනයෙහි සඳහන් කොට ඇත්තාවූ සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට පහක් බැගින් වූ වරිපනම් බද්දක්, පිළිවෙලින් මාර්තු 31 වැනි දින දී ද, ජූනි 30 වැනි දිනදී ද, සැප්තැම්බර් 30 වැනි දිනදී සහ දෙසැම්බර් 31 වැනි දිනයන්හි දී සමාන කොටස් හතරකින් ගෙවා අවසාන කළ හැකි අන්දමට 1967 වර්ෂය සඳහා මීරිගම සුළු නගර සභාව විසින් පනවනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඊ. අමරතුංග,
මීරිගම සුළු නගර සභාවේ සභාපති තැන.

1966 ක්වූ සැප්තැම්බර් මස 23 වැනි දින,
මීරිගම සුළු නගර සභා කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

පහත දැක්වෙන වරිපනම් අංක දරණ ස්ථාන පිහිටි ප්‍රදේශ :—

##### අංක 1 දරණ ඡන්ද කොට්ඨාශය

අඹේපුස්ස පාර : 35/6.
ගිරිඋල්ල පාර : 57, 69, 75, 79, 83, 93, 103, 105, 107, 113, 117, 123, 78, 120/1, 120/3, 122, 170.

##### අංක 2 දරණ ඡන්ද කොට්ඨාශය

දන්ඕවිට පාර : 24, 118.

##### අංක 3 දරණ ඡන්ද කොට්ඨාශය

පස්යාල පාර : 91, 97, 109/1, 119/1, 119/7, 119/8, 119/9, 119/10, 119/11, 119/12, 119/13, 119/16, 119/17, 119/18, 121, 123, 125, 127, 129, 131, 135, 137, 141, 143, 145, 147, 215, 217, 219, 221, 223, 225, 227, 229, 231, 233, 235.
සුමනසාර මාවත : 19.

##### අංක 4 දරණ ඡන්ද කොට්ඨාශය

පස්යාල පාර : 241, 265, 271, 283, 285/1.

##### අංක 5 දරණ ඡන්ද කොට්ඨාශය

ගිරිඋල්ල පාර : 19, 23, 39, 43.
පස්යාල පාර : 2.

10–192—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

## ලුණුගල සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1966 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන ලුණුගල සුළු නගර සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 පරිච්ඡේදය) අංක 7 දරණ වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම කිරීමට අදහස් කරන ස්ථානය |
|---|---|
| ඒ. එච්. බදුර්දීන් මහතා, අංක 126, මඩකලපුව පාර, ලුණුගල. | ලුණුගල පොදු වෙළඳ පොළේ අංක 1 දරණ හරක් මස් කඩය. |

ඩබ්ලිව්. ඒ. පියදාස,
සභාපති වෙනුවට.

1966 සැප්තැම්බර් 24 දින,
ලුණුගල සුළු නගර සභා කාර්යාලයේදීය.

10–200—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ 3 වැනි වගන්තිය යටතේ, කලුතර දිස්ත්‍රික්කයේ බේරුවල් අලුත්ගම් සහ මාලේවන් බදු ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

"පළාත් පාලන ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලැබ, 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් සම්මත කරනලද බව 1965 ජනවාරි මස 8 වන දින අංක 14,287 දරන ගැසට් පත්‍රයේ නිවේදනයකින් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 38 දරන කාණ්ඩය මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මතකර ගැනීමට, බේරුවල් අලුත්ගම් සහ මාලේවන් බදු ගම්සභාව විසින් පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ (261 පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ."

එච්. ඇස්. ද සිල්වා,
බේරුවල් අලුත්ගම් සහ මාලේවන් බදු ගම්සභාවේ සභාපති.

1966 සැප්තැම්බර් මස 26 වන දින,
අලුත්ගම, කලුවාමෝදර,
ගම්සභා කාර්යාලයේදීය.

10–211—66.10.7 දින අංක 14.716 දරන ගැසට් පත්‍රය

---

## මොණරාගල සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් අයවළුන් විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා 1967 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධව මොණරාගල සුළු නගර සභා සීමාව තුල පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ ගැන විරුද්ධ වන්නේ අසවල් කරුන සඳහායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14ක් ඇතුලතදී මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ දාඥාපනතේ (272 වැනි අධිකාරිය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

ආර්. ජේ. ලෙනෝරා,
සභාපති,
මොණරාගල සුළු නගර සභාව.

1966 සැප්තැම්බර් මස 22 වැනි දින,
මොණරාගල සුළු නගර සභා කාර්යාලයේදීය.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | බලපත්‍රයේ විස්තර | ස්ථානය |
|---|---|---|
| 1. ඇස්. ඇම්. ඒ. රසාක් | හරක්මස් වෙළඳාම | 58, වැල්ලවාය පාර, මොණරාගල |
| 2. ඇස්. ඇම්. ඒ. රසාක් | එළුමස් වෙළඳාම ... | 58/1, වැල්ලවාය පාර, මොණරාගල |

10–190—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

## මොණරාගල සුළු නගර සභාව

### 1967 වර්ෂයට වරිපණම් බදු

### සුළු නගරසභා ආඥාපනත (256 පරිච්ඡේදය)

සුළු නගරසභා ආඥාපනත (256 වෙනි පරිච්ඡේදය) යටතේ මෙම ගතවී යන වර්ෂයට බලපවත්නා පහත සඳහන් බදු එලෙසම පැන වීමට නගරසභාව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලබන්නේ 159 වෙනි වගන්තිය ප්‍රකාර මෙම නගරසභා බලමණ්ඩලය තුල පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හය (6) බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වෙනිදුයින් අවසන්වන අයුරු කාර්තු හතරකට ගෙවිය හැකි අයුරිනි.

ආර්. ජේ. ලෙනෝරු,
සභාපති,
මොණරාගල සුළු නගරසභාව.

1966 සැප්තැම්බර් මස 25 වැනි දින,
මොණරාගල සුළු නගරසභා කාර්යාලයේදීය.

10–184/1—66.7.10 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

---

## මොණරාගල සුළු නගර සභාව

### 1967 අවුරුද්ද සඳහා සුනඛ බද්ද

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපණත (334 පරිච්ඡේදය)

334 වැනි පරිච්ඡේදයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපණතේ 4 වැනි වගන්තිය යටතේ මෙම සුළු නගර සභා බලමණ්ඩලය තුළ තබා ගෙන සිටින සෑම බල්ලෙකු සඳහා රුපියල් 1.00 බැගින්ද, සෑම බැල්ලියකු සඳහා රුපියල් 1.50 බැගින්ද, 1967 මාර්තු මස 31 වැනිදා හෝ ඉන් පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් පණවා අයකිරීමට මොණරාගල සුළු නගර් සභාව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

ආර්. ජේ. ලෙනෝරු,
සභාපති,
මොණරාගල සුළු නගරසභාව.

සුළු නගර සභා කාර්යාලයය,
මොණරාගල,
1966 සැප්තැම්බර් 25.

10–184/2—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

## මොණරාගල සුළු නගර සභාව

### 1967 වර්ෂය සඳහා රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

### සුළු නගරසභා ආඥාපනත (256 පරිච්ඡේදය)

මොණරාගල සුළු නගර සභාව මගින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

1. සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයෙන් විස්තරවන ගණන් අනුව 1967 අවුරුද්දට රථවාහන සහ සතුන් සඳහා බද්දක් පණවා අයකිරීමටද,

2. එකී ආඥාපනතේ අංක 162 (3) යටතේ එකී බදු 1967 මාර්තු 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවිය හැකි අයුරින්ද වේ.

ආර්. ජේ. ලෙනෝරු,
සභාපති,
මොණරාගල සුළු නගරසභාව.

සුළු නගර සභා කාර්යාලයය,
මොණරාගල,
1966 සැප්තැම්බර් 25.

#### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ, පා පැදි හෝ රෝදත්‍රයේ පා පැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා ... ... | 5 00 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදියක් හෝ මෝටර් රථයක් හෝ කරත්තයක් :— | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 5 00 |
| (බී) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... ... | 1 00 |
| ගොන් දෙන්නා බඳින සෑම කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 4 00 |
| තනි ගොනා බඳින සෑම බර බාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 3 00 |
| සෑම අත්කරත්තයක් සඳහා ... | 2 50 |
| සෑම රික්ෂෝවක් සඳහා ... ... | 2 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙක් සඳහා | 5 00 |
| සෑම බූරුවෙක් සඳහා ... ... | 1 00 |

10–184/3—66.10.7 දින අංක 14,716 දරන ගැසට් පත්‍රය

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට හෝ පුළුවන.

3. පෝය දිනවලට පෙර දින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. **පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.**

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් **හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.**

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. **වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස්** කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. **උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.**

10. 1966 මාර්තු මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු **මෙසේ යි :—**

| | රු. | ශ. |
|---|---|---|
| **අඟලකට හෝ ඉන් අඩුව** ... ... ... | 15 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 15 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 165 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 330 | 0 |

**අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.**

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" **පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

**12. 1966 මාර්තු 1 වෙනිදා සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 66.7.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | මෙරට රු. | මෙරට ශ. | | පිටරට රු. | පිටරට ශ. |
|---|---|---|---|---|---|
| **එක් කොටසක්** ... ... ... | 36 | 0 | ... | 49 | 0 |
| I වැනි කොටසේ **එක ඡේදයක්** ... ... | 26 | 0 | ... | 31 | 50 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 33 | 50 | ... | 41 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිල රු. | මිල ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. | තැපැල් ගාස්තු මෙරට ශ. |
|---|---|---|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී **එක කොටසක්** ... ... ... | 0 | 40 | ... | 0 | 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, **එක කොටසක්** ... ... ... | 0 | 80 | ... | 0 | 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, I වැනි **කොටසේ එක ඡේදයක්** ... ... | 0 | 20 | ... | 0 | 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ **එක ඡේදයක්** ... ... | 0 | 40 | ... | 0 | 15 |

දායක මුදල් භාරගැනීම සහ තනි පිටපත් විකිණීම භාර **කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි** වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථාන

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. එහි දක්වෙන නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පලකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් සහ ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට යෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

## උපලේඛනය

**1966**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | 66. 9. 9 | සිකුරාද | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.16 | සිකුරාද | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.23 | සිකුරාද | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.30 | සිකුරාද | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | 66.10. 7 | සිකුරාද | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.14 | සිකුරාද | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.20 | බ්‍රහස්පතින්ද | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.27 | බ්‍රහස්පතින්ද | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් | 66.11. 3 | බ්‍රහස්පතින්ද | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.10 | බ්‍රහස්පතින්ද | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.18 | සිකුරාද | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.25 | සිකුරාද | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් | 66.12. 2 | සිකුරාද | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12. 9 | සිකුරාද | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.16 | සිකුරාද | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12.23 | සිකුරාද | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.30 | සිකුරාද | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 ජූලි 15 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

ලංකාවේ වැලවේවතයෙහි පිහිටි නැගෙණහිර කඩදාසි කර්මාන්ත සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි